චක්‍රලේඛ අංකය : 02/2022

මගේ අංකය: MOJ/AC/21/පොදු ගොනුව I/2022

අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

කොළඹ 10

2022.11. 17

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්/දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,

<u>රාජසන්තක කරන ලද වැලි, පස් හා බොරළු බැහැර කිරීමේ ක්‍රියාවලිය</u>

අංක:අමප/21/2205/330/123 දරණ 2022 ජනවාරි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජසන්තක කරන ලද වැලි, පස් හා බොරළු බැහැර කිරීමේදී පහත උපදෙස් අනුගමනය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

02. අධිකරණ වල ගොඩ ගසා ඇති රාජසන්තක කරන ලද වැලි, පස් හා බොරළු කඩිනමින් නියාදනය කිරීම සහ අදාල ද්‍රව්‍ය රාජ්‍ය ආයතන විසින් තම සෘජු ඉදිකිරීම් අවශ්‍යතා සඳහා වැලි, පස් හා බොරළු වෙළඳ පොල පවතින අධික මිල ගණන් යටතේ මිලදී ගනු ලබන බැවින් එකී තත්ත්වයන්ට සහනයක් සලසාදෙනු වස්,

(i) රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ ත්‍රිවිධ හමුදා පරිශ්‍රවල සිදු කරන සෘජු ඉදිකිරීම් කටයුතු සඳහා (කොන්ත්‍රාත්කරුවන් ලවා ඉටු කර නොගන්නා කටයුතු සඳහා පමණක්) සහ එකී පරිශ්‍රවල ඇතිවිය හැකි පස සෝදායාම් හා ගිලා බැසීම් සඳහා පස් පිරවීම් වැනි පිළිසකර කටයුතු සඳහා අධිකරණ මගින් රාජසන්තක කරන ලද වැලි, පස් හා බොරළු නොමිලේ ලබා දීමට කටයුතු කෙරේ.

(ii) ඉහත සඳහන් ආයතන අදාල ද්‍රව්‍යයන් ලබා නොගන්නා අවස්ථා වලදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉටු කරනු ලබන සෘජු ඉදිකිරීම් හා නඩත්තු කටයුතු (කොන්ත්‍රාත්කරුවන් ලවා ඉටු කර නොගන්නා කාර්යයන්) සඳහා දිස්ත්‍රික් මිල කමිටු වල සඳහන් ගාස්තු මත මාර්ග සංවර්ධන අධිකාරිය වෙත එකී ද්‍රව්‍ය අලෙවි කිරීමට කටයුතු කෙරේ.

03. (i) රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ ත්‍රිවිධ හමුදාව විසින් වැලි, පස් හා බොරළු පිලිබඳ ඉල්ලීම් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අදාල විෂයභාර අමාත්‍යාංශය වෙත යොමු කල යුතු අතර, එම අමාත්‍යාංශ නිර්දේශයන්ද සහිතව එම ඉල්ලීම ප්‍රමුඛතා අනුපිලිවෙලින් කටයුතු කිරීමට අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කල යුතුය.

(ii) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වැලි, පස් හා බොරළු සම්බන්ධ ඉල්ලීම් අදාල මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානියාගේ නිර්දේශ සහිතව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කල යුතු අතර, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශයන්ද සහිතව එම ඉල්ලීම ප්‍රමුඛතා අනුපිලිවෙලින් කටයුතු කිරීමට අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කල යුතුය.

(iii) යම් අවස්ථාවක අධිකරණයට ඉහත 03 (i) ට හා 03 (ii) ට අදාලව ඉල්ලීම් ලැබී ඇති අවස්ථාවක එකී අධිකරණ විසින් 03 (i) ට අදාල ඉල්ලීම් ඉටු කිරීමෙන් අනතුරුව 03 (ii) ට අදාල ඉල්ලීම් ඉටු කිරීමට කටයුතු කල යුතු වේ.

04. (i) ඉහත ආකාරයට වැලි පස් හා බොරළු ලබා ගැනීම සම්බන්ධව ඉල්ලීම් ඇමුණුම් 01 හා 02 ආකෘති පත්‍ර අනුව ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර අධිකරණ අමාත්‍යාංශයේ www.moj.gov.lkවෙබ් අඩවියෙන් ලබා ගත හැක.

(ii) අධිකරණ අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබා දීමෙන් පසු එම ඉල්ලීම අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා අදාළ අධිකරණ වෙත යොමු කෙරෙනු ඇත.

(iii) මෙම අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු දින 30ක් ඇතුළත රාජසන්තක කරන ලද වැලි, පස් හා බොරළු අදාළ අධිකරණයෙන් ලබා ගත යුතු වේ.

05. (i) රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ ත්‍රිවිධ හමුදාව විසින් තම සංවර්ධන කටයුතු සඳහා රාජසන්තක කරන ලද වැලි, පස් හා බොරළු ගොඩගසා ඇති ස්ථානයේ සිට පිටතට ප්‍රවාහනය කිරීමේදී 2009 අංක 60 දරණ පනතින් සංශෝධිත 1992 අංක 33 පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 28 (1) ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යයාංශයට නියමිත ගාස්තු ගෙවා ප්‍රවාහන බලපත්‍ර ලබා ගත යුතු වේ.

(ii) මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රාජසන්තක කරන ලද වැලි, පස් හා බොරළු අලෙවි කිරීමේ දී දිස්ත්‍රික් මිල කමිටුව මගින් තීරණය කරන මිල මත අලෙවි කල යුතු අතර, 2009 අංක 60 දරණ පනතින් සංශෝධිත1992 අංක 33 පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 44 (අ) ප්‍රකාරව නියමිත පරිදි රාජ්‍ය භාගය ගෙවිය යුතුය. අයකල මිලෙන් 4%ක් රාජ්‍ය භාගය ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යයාංශය වෙත බැර කල යුතු වේ.

06. වනජීවී රක්ෂිත වලින් නීති විරෝධීව ඉවත් කරන ලද වැලි, පස් හා බොරළු රාජසන්තක කර ඇති අවස්ථා වලදී එකී ද්‍රව්‍ය මාර්ග සංවර්ධන අධිකාරියට අලෙවි කිරීමෙන් ලැබෙන ආදායම වනජීවීන්ගේ සුභ සාධනය වෙනුවෙන් වන සත්ව සංරක්ෂණ අරමුදලට බැර කිරීමට කටයුතු කලයුතු වේ.

07. අදාළ කාලසීමාව තුල රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ ත්‍රිවිධ හමුදාව හා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබා දී ඉතිරි වන රාජසන්තක කරන ලද වැලි, පස් හා බොරළු සංචිත චක්‍රලේඛ අංක 01/2021 ප්‍රකාරව ආගමික සිද්ධස්ථාන වෙත සහන මිලට ලබා දීමෙන් අනතුරුව ඉතිරියක් වේ නම් ප්‍රසි ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු කල යුතුය.

08. ඉහත ආකාරයට ලබා දුන් වැලි, පස් හා බොරළු පිළිබඳ සවිස්තර වාර්තාවක් අදාල අධිකරණ මගින් සෑම මාස 03 කට වරක්ම මෙම අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

09. මෙම චක්‍රලේඛයෙහි අඩංගු විධිවිධානයන් 2022.11.16 දින සිට නැවත දැනුම් දෙන තුරු වලංගු වේ.

වසන්තා පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත්: 1. ලේකම්, මුදල් අමාත්‍යාංශය (දැ.ගැ.ස)
2. ලේකම්, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය (දැ.ගැ.ස)
3. ලේකම්, පරිසර අමාත්‍යාංශය (දැ.ගැ.ස)
4. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය (අ.ක.ස)
5. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය (අ.ක.ස)
6. සභාපති, මාර්ග සංවර්ධන අධිකාරිය (අ.ක.ස)
7.ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව (දැ.ගැ.ස)

ඇමුණුම 01

අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා

ප්‍රමුඛතා අංකය

දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

**අධිකරණ අමාත්‍යාංශය.**

**රජයේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල සිදුකරන සෘජු ඉදිකිරීම්/පිළිසකර කිරීම් සඳහා වැලි,පස් හා බොරළු නොමිලේ ලබා දීම**

1. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය -..............................................................
   ......................................................................................................................
2. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ නම - ..........................................................
3. දුරකථන අංකය - ........................................................................................................
4. අවශ්‍ය අමුද්‍රව්‍ය - වැලි/පස්/බොරළු
5. අමුද්‍රව්‍ය ලබා ගැනීමට අපේක්ෂිත මහේස්ත්‍රාත් අධිකරණය -....................................
6. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සෘජු ඉදිකිරීම්/පිළිසකර කිරීම්
   i. ආරම්භ කල දිනය - ..........................................
   ii. ඉදිකිරීම් කාර්යය කුමක්ද? - ..........................................
   iii. දැනට ඉදිකර ඇති ප්‍රමාණය (දළ වශයෙන්) - ..........................................
   iv. අවශ්‍ය වන අමුද්‍රව්‍ය ප්‍රමාණය කියුබ් - - ..........................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය සහ නිවැරදි බව සහතික කරමි.

...................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා දිනය

ඉහත සඳහන් තොරතුරු පරීක්ෂා කර බලන ලද අතර, නිවැරදි බැවින්, නිර්දේශ කර අනුමැතිය පිණිස ඉදිරිපත් කරමි.

...........................................................

රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

ඉහත නිර්දේශය අනුමත කරමි/නොකරමි.

...........................................................

ලේකම්/ප්‍ර.මු.නි/ප්‍ර.ගණකාධිකාරි

ඇමුණුම 02

| අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා | |
| --- | --- |
| ප්‍රමුඛතා අංකය | |

| | |
| --- | --- |
| දිස්ත්‍රික්කය | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | |

**අධිකරණ අමාත්‍යාංශය.**

**මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉටු කරනු ලබන සෘජු ඉදිකිරීම්/ පිළිසකර කිරීම් සඳහා වැලි,පස් හා බොරළු අලෙවි කිරීම.**

1. ඉල්ලීම කරනු ලබන මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යයාල ලිපිනය -. ..........................
   ..........................................................................................................................
2. අදාල කාර්යයාලයේ ආයතන ප්‍රධානියාගේ නම - ..................................................................
3. දුරකථන අංකය - ..........................................................................................................
4. අවශ්‍ය අමුද්‍රව්‍ය - වැලි/පස්/බොරළු
5. අමුද්‍රව්‍ය ලබා ගැනීමට අපේක්ෂිත මහේස්ත්‍රාත් අධිකරණය -......................................
6. මාර්ග සංවර්ධන අධිකාරියේ සෘජු ඉදිකිරීම්/පිළිසකර කිරීම්
   i. ආරම්භ කල දිනය - ..........................................
   ii. ඉදිකිරීම් කාර්යය කුමක්ද? - ..........................................
   iii. දැනට ඉදිකර ඇති ප්‍රමාණය (දළ වශයෙන්) - ..........................................
   iv. අවශ්‍ය වන අමුද්‍රව්‍ය ප්‍රමාණය කියුබ් - - ..........................................
7. ඉල්ලීම කරනු ලබන කාලයට අදාල අමුද්‍රව්‍ය වල දිස්ත්‍රික් මිල කමිටු මගින් අනුමත මිල ගණන්.
   (ඉදිකිරීම් කරනු ලබන ප්‍රදේශයට අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යයාලය මගින් අනුමත කරන ලද මිල ගණන් වල ඡායා පිටපතක් මේ සමඟ ඉදිරිපත් කල යුතු වේ)
   i. වැලි - ................................
   ii. පස් - ..................................
   iii. බොරළු - .............................

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.......................................................

ප්‍රාදේශීය කාර්යයාල ප්‍රධානියාගේ අත්සන හා දිනය

ඉහත සඳහන් තොරතුරු පරීක්ෂා කර බලන ලද අතර, නිවැරදි බැවින්, නිර්දේශ කර අනුමැතිය පිණිස ඉදිරිපත් කරමි.

..........................................................................

පළාත් කාර්යයාලයේ ප්‍රධානියාගේ අත්සන හා දිනය

ඉහත නිර්දේශය අනුමත කරමි/නොකරමි.

..............................................................

ලේකම්/ප්‍ර.මු.නි/ප්‍ර.ගණකාධිකාරි